# ඉඩම් කොමස ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
011 286 4051


මගේ අංකය / எனது இல / My No. } උපදෙස් පත්‍රිකා අංක 2020/02 ඔබේ අංකය / உமது இல / Your No } දිනය / திகதி / Date } 2020. 08 04

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>දීර්ඝ කාලීන බදු මත බැහැර කිරීමට අනුමැතිය ලද ඉඩම්වල භුක්තිය භාරදීම.</u>

රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 195, 199, 206 අනුව, දීර්ඝකාලීන බදු ලබාදීම සඳහා පුද්ගලයෙකු තෝරාගත් දින සිට විධිමත්ව ඉඩමේ භුක්තිය ලබා දීම සඳහා දීර්ඝකාලයක් ගතවීම හේතුවෙන් බදුකරුවන් මෙන්ම රජය ද අපහසුතාවයට පත්වී තිබේ. විශේෂයෙන්ම වාණිජ හා කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා දීර්ඝකාලීන බදු ලබා දීමට යෝජිත ඉඩම් සම්බන්ධයෙන් වූ විට මෙම තත්ත්වය වඩාත් සංකීර්ණ වී තිබෙන අතර ආයෝජකයින්ට ඉඩමේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට දීර්ඝකාලයක් ගතවීම හේතුවෙන් ආයෝජනයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකිවීමත්, සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට අවස්ථාව නොලද කාලයට ද බදුගෙවීමට සිදුවීමත් නිසා ආයෝජක ප්‍රජාව අධෛර්යයට පත් වී ඇති බව නිරීක්ෂණය කළ හැකිය. මේ හේතුවෙන් රජයට අයවිය යුතු බදු ආදායම අයකර ගැනීම ද ගැටළුවක් වී තිබේ. එබැවින් දීර්ඝකාලීන බදු ලබා දීමේ ක්‍රියාවලියේ සංකීර්ණභාවය අවම කරමින් යම් යම් කාර්යයන් වැඩිදියුණු කිරීමටත්, කාර්යයන් ඒකාබද්ධ කිරීමටත් ජනාධිපති ලේකම්තුමා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකඟතාවය ලබා දී ඇත. එබැවින් මින් ඉදිරියට වාණිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු ලබාදෙන ඉඩම් සම්බන්ධයෙන් මෙහි උපදෙස් අනුව කටයුතු කරන ලෙස මෙමගින් දන්වා සිටිමි.

02. රජයේ ඉඩමක් දීර්ඝකාලීන බදුලබාදීම සඳහා තීරණය කළ වහාම දීර්ඝකාලීන බදුලබාදීම සඳහා වූ නිර්දේශ වාර්තා කඩිනමින් මා වෙත එවීමට කටයුතු කරන්න. රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 195 අනුව විධිමත්ව ඉඩම් කච්චේරි මගින් පුද්ගලයන් තෝරාගෙන ඇති විට, ඉඩම් කච්චේරි අවසන් තේරීම් ලැයිස්තුව ප්‍රසිද්ධ කළ වහාම දීර්ඝකාලීන බදුලබාදීම සඳහා කටයුතු ආරම්භ කරන්න. අවසන් තේරීම් ලැයිස්තුවේ නම් සඳහන් සියළු දෙනා සම්බන්ධයෙන්ම එකම අවස්ථාවේ බදු නිර්දේශ සැකසීමට කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ඔබ විසින් යොමු කරන නිර්දේශ අනුව රජයේ ඉඩම් ආඥා පනතේ 21 වගන්තිය අනුව දීර්ඝකාලීන බදු ලබා දීම සඳහා වූ අනුමැතිය මා විසින් පළාත් ඉඩම් කොමසාරිස්ට පිටපත් සහිතව ඔබ වෙත දන්වා එවනු ඇත. එම අනුමැතිය ලද පසු ඉඩම මැනුම් කර නොමැති නම් මැනුම් ඉල්ලීමක් හා බදු රේඛා චිත්‍රය ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම මිනින්දෝරු අධිකාරී වෙත යොමු කරන්න. ඉඩම මැන පිඹුර හා කැබලි විස්තර ලැයිස්තුව ලද පසු තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකරන්න. දැනටමත් මායිම් ගල් දමා මැන ඇති ඉඩමක් නම් බදු රේඛා චිත්‍රය ලබාගැනීම සඳහා මැනුම් ඉල්ලීමක් මැනුම් අධිකාරි වෙතත්, තක්සේරු වාර්තා ලබාගැනීම සඳහා වූ ඉල්ලීම තක්සේරු දෙපාර්තමේන්තුව වෙතත් ප්‍රමාදයකින් තොරව යොමු කරන්න.

03. ඉඩමේ භුක්තිය විධිමත්ව භාරදීම, තක්සේරු වාර්තා ලද පසු බදු මුදල් හා වාරමුදල් අයකිරීමෙන් අනතුරුව සිදුකළයුතු වුවද, බදු අනුමැතිය ලද වහාම බදුකරු වෙත දළ වශයෙන් ඉඩමේ මායිම් පෙන්වා දී සංවර්ධනය කිරීම සඳහා ඉඩමට ප්‍රවේශ වීමට අවස්ථාව ලබාදෙන්න. එමගින් බද්ද ආරම්භ වන දිනය හා බදුකරු වෙත ඉඩමේ භුක්තිය ප්‍රවේශවීමට අවස්ථාව ලද දිනය අතර ඇති කාල පරතරය අවම කරගත හැකිවේ.

04. බදු අනුමැතිය ඔබ වෙත දන්වන අවස්ථාවේ දී මා විසින් බදුකරු වෙත ඉඩමට ප්‍රවිශ්ට වී සංවර්ධනය කිරීමට අවසර ලබා දීම සඳහා ආකෘතියක්ද ඔබ වෙත එවන අතර එම ආකෘතිය පිටපත් 03 ක් අත්සන් කර එක් පිටපතක් මා වෙත එවිය යුතුය. බදුකරු විසින් කොන්දේසිවලට යටත්ව ඉඩමට ප්‍රවේශ වී සංවර්ධනය කරන බව තහවුරු කරගැනීම සඳහා නිරන්තරයෙන් පසු විපරම් කරන්න. 2019.01.01 දිනෙන් පසුව බදු අනුමැතිය ලබාදුන් ඉඩම් සම්බන්ධයෙන් මෙම ක්‍රමවේදය අදාළ කරගත යුතු අතර 2019.01.01 දිනෙන් පසුව බදු අනුමැතිය ලබාදුන් ඉඩම් සඳහා තවමත් බදුකරුවන් වෙත ඉඩමට ප්‍රවේශ වීමට අවස්ථාව ලැබී නොමැති නම්, මෙහි සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින් බදුකරු වෙත ඉඩමට ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දෙන්න.

05. ඉන් පසු මාගේ 2020/40 චක්‍රලේඛය අනුව දීර්ඝ කාලීන බදු සැකසීම සඳහා කටයුතු කරන්න. බදු අනුමැතිය ඔබ වෙත එවනා අවස්ථාවේදීම මා විසින් ඔබ වෙත මේ සම්බන්ධයෙන් සකසන ලද දත්ත පද්ධතියේ මෘදු පිටපතක් විද්‍යුත් තැපෑලෙන් එවන අතර එහි මැනුම් ඉල්ලීම යවන ලද දිනය, තක්සේරු වාර්තාව ඉල්ලා යවන ලද දිනය, ඉඩමට ප්‍රවේශ වීමට අවසරය දුන් දිනය යන තීරු සම්පූර්ණ කර, ඔබ වෙත යොමු කරන ලද විද්‍යුත් කැෂැල් ලිපිනයට නැවත ප්‍රති පෝෂණයක් යොමු කරන්න.

06. රජයේ බදු ආදායම එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහාත්, ආයෝජකයන් දිරිමත් කිරීම සඳහාත් මෙහි උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර යම් ගැටළුවක් වේනොත් මා විමසන්න.

ආර්.එම්.සී.එම්. හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ගැ.ස.
02. ලේකම් , ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
03. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරු/ සහකාර ඉඩම් කොමසාරිස්වරු - කා.දැ.ගැ.ස.
04. මැනුම්පති , මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
05. ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
06. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
07. ඉඩම් කොමසාරිස්, I, II, III - කා.දැ.ගැ.ස., අ.කා.ස